// මෙම පිටුවේ පරිච්ඡේද ශීර්ෂය //

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1810/20 - 2013 මැයි මස 13 වැනි සඳුදා - 2013.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 2/2012.

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත**

කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සම්බන්ධතා පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ගාමිණී ලොකුගේ,
කම්කරු සහ කම්කරු සම්බන්ධතා අමාත්‍ය.

2013 මැයි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත 1958 ඔක්තෝබර් 31 වැනි දින අංක 11,573 දරන *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1958 සේවක අර්ථසාධක අරමුදල් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) 6 වැනි නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"6අ (1) (අ) යම් සේවානියුක්තිකයකු පනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලේ සාමාජිකයකු වන අවස්ථාවක දී, කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි එක් එක් පරිපාලන ප්‍රදේශය සම්බන්ධයෙන් එම සේවානියුක්තිකයා සඳහා විශේෂිත වූ හඳුනාගැනීමේ අංකයක් වශයෙන් 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පත් අංකය කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පවරාදෙනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ජාතික හැඳුනුම්පත සන්තකයේ නොමැති යම් සේවානියුක්තිකයකු සම්බන්ධයෙන් කොමසාරිස් - ජනරාල්වරයා විසින් හඳුනාගැනීමේ අංකයක් පවරා දෙනු ලැබිය යුතු ය.

(ආ) එම සේවානියුක්තිකයා පනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලේ සාමාජිකයකු වන අවස්ථාවක දී, එකී සේවානියුක්තිකයාගේ සේවායෝජකයා වෙත කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා විසින් අනුක්‍රමික අංකයක් සහ ඉංග්‍රීසි හෝඩියේ අක්ෂරයක් පවරා දෙනු ලැබිය යුතු ය.

(2) කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා වෙත සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත භාරදිය යුතු සියලු වාර්තාවල, සේවා නියුක්තිකයාගේ පිළිවෙලින් ජාතික හැඳුනුම්පතේ නමට අනුරූපවන හෝ කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා හඳුනා ගැනීමේ අංකය පවරා දී ඇති නමට අනුරූප වන එම ජාතික හැඳුනුම්පත් අංකය හෝ කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා විසින් පවරා දී ඇති හඳුනා ගැනීමේ අංකය සෑම සේවායෝජකයකු විසින්ම සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) සෑම සේවා නියුක්තිකයෙකු විසින්ම කම්කරු දෙපාර්තමේන්තුවේ ඉලෙක්ට්‍රොනික වාර්තා ස්වරූපයෙන් ස්වකීය වම් මාපටගිල්ලේ සහ දකුණු මාපටගිල්ලේ ඇඟිලි සලකුණු ලියාපදිංචි කරනු ලැබිය යුතු ය."

(2) 7වැනි නියෝගයේ (2) වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(2) (අ) පනත යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට යටත්වන සහ අවම වශයෙන් සේවානියුක්තිකයින් පනහක් සේවයේ නියුක්තකර ඇත්තා වූ සෑම සේවායෝජකයෙකුම දායක මුදල් ගෙවීම සඳහා ලියාපදිංචි වන අවස්ථාවේ දී, මෙහි හතරවන උපලේඛනයේ EM-1 අකෘතියට සාරානුකූලව ඉලෙක්ට්‍රොනික වාර්තා පද්ධතියෙන් වූ ලියාපදිංචි ආකෘති පත්‍රයක් ශ්‍රී ලංකා මහබැංකුව වෙත පිටපතක් ද සමග කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) 7 වැනි නියෝගයේ (2) වැනි ඡේදයේ (අ) උපඡේදය යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට යටත්වන සෑම සේවායෝජකයෙකුම විසින් මෙහි පස්වන උපලේඛනයේ EM- 2 -සහ EM-3 යන පරිසනක ලිපිගොනු ආකෘතිවලට සාරානුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පිටපතක් ද සමග ඉදිරි මාසයේ අවසානයට පෙර කම්කරු කොමසාරිස් - ජනරාල්වරයා වෙත මාසික වාර්තාවක් භාරදෙනු ලැබිය යුතු ය."

(3) 7 වැනි නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"7 අ. කොමසාරිස් - ජනරාල්වරයා විසින් හෝ තමා වෙනුවෙන් ඔහු විසින් බලය ලබාදුන් වෙනත් යම් නිලධරයකු විසින් උචිත බවට හෝ අවශ්‍ය බවට තමා විසින් සලකනු ලබයි නම්, සේවායෝජකයා විසින් ඉලෙක්ට්‍රොනික ලෙස සාදන ලද ඔහු විසින් සහතික කරන ලද මුද්‍රිත පිටපතක් සපයන ලෙස එම සේවායෝජකයා වෙත ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර සේවායෝජකයා එම ඉල්ලීමට එකඟව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

(4) 8 වැනි නියෝගයේ "ඇ ආකෘතිය" වන වචන වෙනුවට "ඇ (1) ආකෘති පත්‍රයක් ද සමග "ඇ" ආකෘතිය යන වචන ආදේශ කිරීමෙන්,

(5) 9 වැනි නියෝගයේ "මෙහි දෙවන උපලේඛනයේ "ඇ" "ආකෘතිය" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි මෙහි දෙවන උපලේඛනයේ ඇ ආකෘතිය හෝ පස්වන උපලේඛනයේ පරිගණක ලිපිගොනු ආකෘති පත්‍ර EM -2 සහ EM-3 යන වචන ආදේශ කිරීමෙන්,

(6) 31 වැනි නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"31 අ. පනතේ 23අ වගන්තියේ සඳහන් ප්‍රතිලාභ ගෙවීම් සඳහා වූ සෑම හිමිකම්පෑමක්ම මෙහි දෙවන උපලේඛනයේ "ණ" ආකෘතියට සාරානුකූල විය යුතු ය."

(7) 33 වැනි නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"33 (අ) 1 (අ) පනතේ 23 අ වගන්තියේ කාර්ය සඳහා නිවාස ප්‍රතිලාභ වෙනුවෙන් සුදුසුකම් ලැබීම සඳහා සියලු සාමාජිකයින් විසින් පහත සඳහන් ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. :-

(අ) නිවසක් ඉදිකිරීම සඳහා, නිවසක් ඉදිකිරීමට ඉඩමක් මිලදී ගැනීම සඳහා හෝ නිවසක් මිලදී ගැනීම සඳහා -

(i) සේවානියුක්තිකයාගේ නමින් පවතින ඉඩමේ හිමිකම් ඔප්පුව,
(ii) අදාළ ප්‍රාදේශීය සභාව හෝ පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ඉදිකිරීමට නියමිත නිවසේ සැලසුම,
(iii) ඉඩමේ අයිතිය තහවුරු කරමින් ප්‍රසිද්ධ නොතාරිස්වරයාගෙන් ලබාගන්නා සහතික පත්‍රයක්,

(iv) සේවානියුක්තිකයා ඉඩමේ හෝ නිවසේ අයිතිකරු නොවේ නම්, ඉඩම හෝ නිවස සේවානියුක්තිකයාට විකිණීමට තමා කැමති බවට විකුණුම්කරුගෙන් කැමැත්ත ලබාගන්නා ලිපියක්,
(v) ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද ඉඩම හෝ නිවස පිළිබඳ සේවානියුක්තිකයාගේ හෝ විකුණුම්කරුගේ හිමිකම් ඔප්පුවේ පිටපතක්, හිමිකම් වාර්තාව සහ පෙළපත් සටහන.

(ආ) නිවාස දේපළක් උකස්කරයකින් නිදහස් කර ගැනීම සඳහා -

(i) උකස් ඔප්පුව,
(ii) උකස්කරයේ වටිනාකම සහ ගෙවිය යුතු හිඟ මුදල,
(iii) අදාළ බැංකු කළමණාකරු විසින් සහතික කරන ලද ගෙවිය යුතු හිඟ මුදල.

(ඇ) අනුමත බැංකුවකින් ලබාගත් නිවාස ණය මුදලක් ගෙවා නිම කිරීම සඳහා -

(i) සේවානියුක්තිකයා විසින් ලබාගත් නිවාස ණය මුදල පිළිබඳ බැංකු කළමණාකරුගේ සහතික සහ අදාළ බැංකු කළමණාකරුගෙන් ණය මුදලක් වශයෙන් ලබාගත් මුදල පිළිබඳ සහතිකය.
(ii) අදාළ බැංකු කළමණාකරු විසින් සහතික කරන ලද ගෙවිය යුතු හිඟ මුදල.

(ආ) පනතේ 23 අ වගන්තියේ කාර්ය සඳහා, වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම සඳහා සියලු සාමාජිකයින් විසින් පහත සඳහන් ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(i) රජයේ රෝහලක සෞඛ්‍ය අධිකාරිගෙන් හෝ ඔහු විසින් බලය පවරා දෙන ලද යම් නිලධරයෙකුගෙන් ලබාගන්නා සහතිකය, හෝ
(ii) පෞද්ගලික රෝහලක පරිපාලන කළමණාකරුගේ ලිපියක් ද සමග අරමුදලේ සාමාජිකයා, ඔහුගේ හෝ ඇයගේ කළත්‍රයා හෝ ළමුන් සඳහා ප්‍රතිකාර ලබාදුන් වෛද්‍යවරයාගේ සහතිකය.

(ඇ) මෙම නියෝගයේ "නිවාස සහ වෛද්‍ය ප්‍රතිකාර" යන යෙදුම් සඳහා පනතේ ඇති අර්ථයන්ම තිබිය යුතු ය.

(2) පනතේ 23 අ වගන්තියේ කාර්ය සඳහා, සේවානියුක්තිකයකු විසින් ලබාගත හැකි උපරිම ප්‍රතිලාභ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දෙකක් නොඉක්මවිය යුතු ය."

(8) 42 වැනි නියෝගය, (1) වැනි ඡේදයේ (උ) උපඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් උපඡේදය ආදේශ කිරීමෙන්,

"(උ) අරමුදලේ සාමාජිකයෙකු ලෙස පිළිගෙන ඇත්තා වූ සෑම සේවානියුක්තිකයෙකුම අරමුදලේ ස්වකීය තනිපුද්ගල ගිණුමේ බැරට මුදල් පවතින තාක්කල් සාමාජිකයෙකු වශයෙන් අඛණ්ඩව සිටිනු ලැබිය යුතු ය."

(9) 61 වැනි නියෝගයේ (1) වැනි ඡේදයේ "මුදල් ඇණවුමක් මගින්" යන වචන වෙනුවට "මුදල් ඇණවුමක්, සෘජු බැංකු හර ක්‍රමයක් මගින්, වාණිජ බැංකු ස්වයංක්‍රීය ගෙවීම් ක්‍රමයක් මගින්" යන වචන ආදේශ කිරීමෙන්.

(10) 66වැනි නියෝගයේ :-

(අ) "කොමසාරිස්වරයා" යන අර්ථනිරූපණයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"ඉලෙක්ට්‍රොනික ලේඛනය" යන්නෙන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සාදන ලද, ගබඩා කරන ලද, උත්පාදනය කරන ලද, ලැබුණු හෝ සන්නිවේදනය කරන ලද යම් ලිඛිත ලේඛනයක් හෝ වෙනත් වාර්තාවක් අදහස් වේ.

(ආ) "සාමාජිකයා" යන අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන්,

"වාර්තා" යන්නට ඉලෙක්ට්‍රොනික වාර්තා සහ ඉලෙක්ට්‍රොනික ලේඛන ඇතුළත් වේ.

(11) මෙහි දෙවැනි උපලේඛනයේ,

(අ) "ඈ ආකෘතියට" ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්,

*(8 වන නියෝගය)*

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත**

*"ඇ 1 ආකෘතිය"*

කම්කරු කොමසාරිස් ජනරාල්,
සේවක අර්ථසාධක අරමුදල,
කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

1. ආයතනයේ හෝ වත්තේ නම :——————.
2. සේවානියුක්තිකයන් පිළිබඳ විස්තර :

| අංකය | සේවා නියුක්ති කයාගේ නම | ලිපිනය | බඳවාගනු ලැබූ දිනය | ජා.හැ.පත් අංකය | බඳවාගනු ලැබූ දිනයේ වැටුප | සේවානියු ක්තියේ ස්වභාවය | උපන් දිනය | පසුගිය සාමාජිකත්ව අංක |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |
| 6 | | | | | | | | |
| 7 | | | | | | | | |
| 8 | | | | | | | | |
| 9 | | | | | | | | |
| 10 | | | | | | | | |

(අවශ්‍ය වේ නම් වෙනම පත්‍රිකා අමුණන්න.)

3. සේවායෝජකයා පිළිබඳ විස්තර :

(අ) ව්‍යාපාරයේ ස්වභාවය (කරුණාකර උචිත කොටුව තුළ ලකුණු කරන්න.)

| | | | |
|---|---|---|---|
| පරම අයිතිය | | රාජ්‍ය නොවන ආයතනය | |
| හවුල් ව්‍යාපාරය | | රජය විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිය | |
| සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගම | | සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කල සමූපකාර සමිතිය | |
| අර්ධ රාජ්‍ය ආයතනය | | වෙනත් | |

(ආ) සේවායෝජකයා/සේවායෝජකයන් පිළිබඳ විස්තර :

| අංකය | සේවායෝජකයාගේ /හවුල්කරුගේ/ අධ්‍යක්ෂකගේ නම | පුද්ගලික ලිපිනය | ජා. හැ. පත් අංකය (විදේශ ගමන් බලපත්‍ර අංකය) | දුරකථන අංකය | ඊමේල් ලිපිනය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

(අවශ්‍ය වේ නම් වෙනම පත්‍රිකා අමුණන්න.)

4. සේ. අ. අරමුදල් කලින් ගෙවා ඇත්නම්, කුමන අංකය යටතේදැයි සඳහන් කරන්න. :.....................
5. අයිතිය පිළිබඳ යම් වෙනසක් සිදුවේ නම්, එම වෙනස්වීම් සහ දින පිළිබඳ විස්තර ඔබ වෙත දැනුම්දීමට මම එකඟ වෙමි.

———————,

දිනය :—————. සේවායෝජකයාගේ අත්සන.

සේවායෝජකයාගේ තනතුර :—————.

සේවායෝජකයාගේ නිල මුද්‍රාව ෑ

(ආ) "ඩ " ආකෘතියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන් ෑ-

(*31 අ නියෝගය*)

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත**

*"ණ" ආකෘතිය*

*I වැනි කොටස*

පනතේ 23 අ වගන්තිය යටතේ ගෙවිය යුතු ප්‍රතිලාභ සඳහා වූ 26 වන වගන්තිය යටතේ කරනු ලබන හිමිකම් ඉල්ලීම.

(මෙම හිමිකම් ඉල්ලීම සේවානියුක්තිකයාගේ සේවායෝජකයා මගින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත එවිය යුතු වේ.)

1. සාමාජිකයාගේ සම්පූර්ණ නම :—————.
2. ලිපිනය :—————.
3. සාමාජිකයාගේ පියාගේ සම්පූර්ණ නම :—————.
4. සාමාජිකයාගේ මවගේ සම්පූර්ණ නම :—————.
5. කළත්‍රයාගේ සම්පූර්ණ නම (විවාහක නම්) :—————.
6. සාමාජිකයාගේ ළමුන්ගේ සම්පූර්ණ නම් :—————.

| නම | උපන් දිනය |
|---|---|
| .................................................. | .................................. |
| .................................................. | .................................. |

7. සාමාජිකයා පිළිබඳ යම් ස්වභාවික විශේෂිත කරුණු :—————.
8. සාමාජිකත්ව අංක (සේවායෝජක අංකය සහ සාමාජික අංකය මෙන්ම සාමාජිකත්ව B කාඩ්පත ද අමුණන්න) :———.

| | සේවායෝජක අංකය | | | | | ඉංග්‍රීසි හෝඩියේ අක්ෂරය | සාමාජික අංකය | | | | | සේවය අවසන් වූ දිනය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්තමාන සේවායෝජක යටතේ සේවානියුක්තිකයාගේ විස්තර | | | | | | | | | | | | අ | අ | අ | අ | මා | මා | දි | දි |
| පසුගිය සේවායෝජකයන් යටතේ පසුගිය සාමාජිකත්ව අංක | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

9. සාමාජිකයාගේ වයස සහ උපන් දිනය :—————.
10. සේ. අ. අරමුදලින් (නිවාස හෝ වෛද්‍ය) 30% ප්‍රතිලාභ ඉල්ලා සිටින ලද ප්‍රභේදය :—————.
11. වර්තමාන සේවායෝජකගේ නම සහ ලිපිනය :—————.

*ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :*

ජාතික හැඳුනුම්පතේ සඳහන් නම :——————.

ජාතික හැඳුනුම්පත් අංකය :——————.

නිකුත් කළ දිනය :——————.

මෙයට අමතරව සේවායෝජක විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණා තිබිය යුතු වේ.

*බැංකු ගිණුම් හිමියන් සඳහා :*

ගිණුමේ වර්ගය - (ඉතුරුම්/ජංගම ගිණුම්) :——————. බැංකුවේ නම :——————.

ගිණුම් අංකය :——————. බැංකු ශාඛාව :——————.

විස්තරාත්මක පිටුවේ/ජංගම ගිණුමේ මාසික බැංකු ප්‍රකාශයේ පිටපතක් අමුණා තිබිය යුතු වේ.

ඉහත කී බැංකුවේ මාගේ බැංකු ගිණුම වෙත බැර කිරීම සඳහා හැකි වන පරිදි කරුණාකර චෙක්පත් අණකර යොමුකරන්න.

——————,
සාමාජිකයාගේ අත්සන.

දිනය :——————.

*නම් සහතික කිරීම :*

උප්පැන්න සහතිකයේ/විවාහ සහතිකයේ සඳහන් පරිදි නම :——————.

ජාතික හැඳුනුම්පතේ සඳහන් නම :——————.

B කාඩ්පතේ සඳහන් නම (සාමාජිකත්ව කාඩ්පත) :——————.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ. අ. අ. සඳහන් නම :——————.

ඉහත සඳහන් සියලු නම්වලින් හැඳින්වනුයේ එකම තැනැත්තකු බව මා විසින් මෙයින් සහතික කර සිටිමි.

——————,
සේවායෝජකයාගේ අත්සන.

*සාමාජිකයාගේ මාපටඟිලි සළකුණ :*

| වම | දකුණ |
|---|---|
| | |

සාමාජිකයාගේ අත්සන සහ මාපටඟිලි සළකුණට සාක්ෂිකරුගේ අත්සන :——————.

සාක්ෂිකරුගේ නම, තනතුර සහ ලිපිනය :——————.

*II වැනි කොටස* (සේවායෝජකයා විසින් සම්පූර්ණ කළ යුතු වේ.)

.............................................. පිහිටා ඇති ................................................. ආයතනයේ කළමනාකරු/අධිකාරී/අයිතිකරුවන .......................................... වන මා/අප විසින් ඉහත කී වත්තේ/ආයතනයේ .............................................. වශයෙන් සේවයේ නියුක්ත සාමාජික අංක ................................ දරන .......................................... යන අය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයකු බවට මෙයින් සහතික කර සිටිමි./සිටිමු. ඔහු/ඇය විසින් මෙම ඉල්ලීමේ 10 වන අයිතමය යටතේ සිදුකරනු ලබන ප්‍රකාශය යටතේ හිමිකම් ඉල්ලා සිටියි. ඔහුගේ/ඇයගේ දායක මුදල් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කර ඇති අතර අවසාන මාසයේ දායක මුදල 20.................... වර්ෂය ...................... මාසය සඳහා වූ දායක මුදල් වාර්තාවේ ඇතුළත් කර ඇත.

සේවායෝජක අංකය :——————. අත්සන :——————.

දිනය :——————.

(12) තුන්වන උපලේඛනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීමෙන් :-

**හතරවන උපලේඛනය**

*(ආකෘති පත්‍රය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය.)*

**EM – 1**

[*7(2)(අ) නියෝගය*]

ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය - e - වාර්තා ක්‍රමය
සේවක අර්ථසාධක අරමුදල
කම්කරු කොමසාරිස් ජනරාල්වරයා (සේ. අ. අ.)
අධිකාරී (සේ. අ. අ.)

සේ. අ. අ. අංක .......................................... දරන .................................... වන (සේවායෝජකයාගේ නම) මා/අප විසින් 20 ....................... මාසයේ සිට - e - වාර්තා ක්‍රමය තුළින් සේ. අ. අ. දායක මුදල් විස්තර සැපයීමට එකඟ වෙමි/එකඟ වෙමු.

01. සේවායෝජකයාගේ විස්තර :

1.1 සේවානියුක්තියේ නම :

1.2 සේවායෝජක අංකය : /

1.3 තැපැල් ලිපිනය :

1.4 කර්මාන්තයේ/ව්‍යාපාරයේ ස්වභාවය :

02. සේවානියුක්තිකයන් ගණන :

2.1 සම්පූර්ණ සේවානියුක්තිකයන් ගණන : දි දි මා මා ව ව වන විට

2.2 සාප්පු සහ කාර්යාල පනත යටතේ වූ සම්පූර්ණ සේවානියුක්තිකයන් ගණන :

2.3 පඩි පාලක මණ්ඩලය පනත යටතේ වූ සම්පූර්ණ සේවානියුක්තිකයන් ගණන :

2.4 වෙනත් ප්‍රභේද යටතේ වූ සේවා නියුක්තිකයන් ගණන :

03. e - වාර්තා වශයෙන් යවනු ලබන ලිපිගොනු ගණන :

04. සේවායෝජකයාගේ ලිපි හුවමාරුව පිළිබඳ විස්තර :

4.1 ඇමතුම් කළ හැකි නිලධරයන්ගේ නම් : (i) (ii)

4.2 දුරකථන අංක : ජංගම දුරකථනය : (i) (ii)

බිම් දුරකථනය : (iii) (iv)

4.3 ෆැක්ස් අංකය :

4.4 ඊ මේල් ලිපිනය (ප්‍රධාන) :

4.5 ඊ මේල් ලිපිනය (විකල්ප) : (ii) (iii)

05. ගෙවීමේ ක්‍රමය : චෙක්පත සෘජු හරකිරීම මුදල්

වෙනත් (සඳහන් කරන්න)

06. e - වාර්තා ක්‍රමය : සේ. අ. අ. ඊමේල්/වෙබ් අඩවිය

වෙනත් (සඳහන් කරන්න)

07. - e - ඊ වාර්තා යැවීම ආරම්භ වන මාසය : මා මා අ අ අ අ

ඉහත සපයා ඇති විස්තර සත්‍ය සහ නිවැරදි බවට මා/අප විසින් මෙයින් ප්‍රකාශ කර එකඟවන අතර මෙම ආකෘතියේ සඳහන් තොරතුරු පිළිබඳ යම් මූලාශ්‍රයකින් සේ.අ.අ. විසින් තහවුරු කර ගැනීම සඳහා එකඟ වන අතර අප විසින් කලින් සපයනු ලැබූ මෙහි සඳහන් මාගේ සේවා නියුක්තිය පිළිබඳ සියලු තොරතුරු සේ. අ. අ. සමග යාවත්කාලීන කර ගැනීම සඳහා ප්‍රකාශිතව කැමැත්ත ප්‍රකාශ කර එකඟව සිටිනු ලැබේ. ලබා දුන් විස්තරවල යම් වෙනස්වීමක් කඩිනමින් නිවේදනය කරනු ලැබේ.

08.

බලයලත් නිලධරයාගේ අත්සන සහ මුද්‍රාව.

දිනය

**පස්වන උපලේඛනය**

**EM -2**

*7(2) (ආ) නියෝගය*

ගෙවීම් විස්තර ලිපිගොනුව- (EVEMP. TXT)

ලිපිගොනු නම : (සේ. අ. අ. ලියාපදිංචි අංකය + P) + txt

| අංකය | ක්ෂේත්‍රය | ප්‍රමාණය | ස්වභාවය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | කලාප සංකේතය | 1 | දත්ත ලෙස | කලාප සංකේතය |
| 2 | සේවක අංකය | 6 | සංඛ්‍යාත්මක | සේවායෝජක අංකය |
| 3 | දායක කාලසීමාව | 6 | සංඛ්‍යාත්මක | දායක වර්ෂය සහ මාසය |
| 4 | භාරදුන් ID | 2 | සංඛ්‍යාත්මක | දත්ත භාරදීමේ අංකය |
| 5 | සම්පූර්ණ දායක මුදල | 11.2** | සංඛ්‍යාත්මක | භාරදුන් මුලු දායක මුදල |
| 6 | ගණනය කළ සාමාජිකයින් | 5 | සංඛ්‍යාත්මක | දායකත්වය දැක් වූ සාමාජිකයින් ගණන |
| 7 | ගෙවීමේ ක්‍රමය | 1 | සංඛ්‍යාත්මක | ගෙවීම් ක්‍රමය<br>1 = චෙක්පත 2 = මුදල් - 3 = මුදල් ඇණවුම<br>4 = සෘජු හර කිරීම |
| 8 | ගෙවීම් යොමුව | 20 | අන්තර්ගතය | ගෙවීම් යොමුව<br>(බැංකු සංකේතය, ශාඛා සංකේතය සහ චෙක්පත් අංකය) |
| 9 | ගෙවීම් දිනය | 10 | සංඛ්‍යාත්මක | ගෙවීම් දිනය (අඅඅඅ මා මාදිදි) |
| 10 | දි/කා සංකේතය | 2 | දත්ත ලෙස | දිස්ත්‍රික් කාර්යාල සංකේත අංකය (9 වන ඇමුණුම බලන්න) |

* (සියලු කාර්ය මණ්ඩලය ඇතුළත්ව) එක් ලිපිගොනුවක් වශයෙන් විස්තර යවනු ලබයි නම්, අංකය "01" විය යුතු ය. "විධායක සහ විධායක නොවන" වශයෙන් ප්‍රභේද දෙකක් යටතේ විස්තර යවනු ලබයි නම් අංකය "02" විය යුතු ය.

11. 2 ** = පූර්ණ සංඛ්‍යා 9 ක්, දශම තිත සහ දශම සංඛ්‍යා 2 ක් ඇතුලුව උපරිම සංඛ්‍යා 12 ක් තිබිය යුතු වේ.

## EM-3

*7(2) (ආ) නියෝගය*

දායකත්ව විස්තර ලිපිගොනුව - (EVEMC.TXT)

ලිපිගොනු නම : (සේ. අ. අ. ලියාපදිංචි අංකය .+ C) + txt

| අංකය | ක්ෂේත්‍රය | ප්‍රමාණය | ස්වභාවය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | ජා. හැ. ප. අංකය | 20 | දත්ත ලෙස | ජා. හැ. පත්/විදේශ ගමන් බලපත්‍ර අංකය |
| 2 | අවසාන නම | 40 | දත්ත ලෙස | අවසාන නම |
| 3 | මුලකුරු | 20 | දත්ත ලෙස | මුලකුරු |
| 4 | සාමාජික අංකය | 6 | සංඛ්‍යාත්මක | සාමාජික ගිණුම් අංකය |
| 5 | සම්පූර්ණ දායක මුදල | 9.2* | සංඛ්‍යාත්මක | සම්පූර්ණ දායක මුදල (රු.) |
| 6 | සේවායෝජක දායක මුදල | 9.2* | සංඛ්‍යාත්මක | සේවායෝජක දායක මුදල (රු.) |
| 7 | සාමාජික දායක මුදල | 9.2* | සංඛ්‍යාත්මක | සාමාජිකයාගේ දායක මුදල (රු.) |
| 8 | සම්පූර්ණ ඉපයීම් | 11.2** | සංඛ්‍යාත්මක | සම්පූර්ණ ඉපයීම් (රු.)<br>අතිකාල ගෙවීම් හැර, මාසය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ පඩි හෝ වැටුප<br>* මූලික පඩිය හෝ වැටුප, ජීවන වියදම් දීමනාව, කැලි ගණනට ගෙවීම, දිරිදීමනා ගෙවීම් ඇතුළත් කළ යුතු ය. |
| 9 | සාමාජික තත්ත්වය | 1 | දත්ත ලෙස | සාමාජිකත්ව තත්ත්වය<br>දී - දීර්ඝකල අ - අලුත් හැ- හැරගිය |
| 10 | කලාප සංකේතය | 1 | දත්ත ලෙස | කලාප සංකේතය |
| 11 | සේවායෝජක අංකය | 6 | සංඛ්‍යාත්මක | සේවායෝජක අංකය |
| 12 | දායක කාලසීමාව | 6 | සංඛ්‍යාත්මක | දායක වර්ෂය, මාසය |
| 13 | IDභාරදීම | 2 | සංඛ්‍යාත්මක | දත්ත භාරදීමේ අංකය *** |
| 14 | දිනක වැඩ | 4.2* | සංඛ්‍යාත්මක | වැඩ කරන ලද දින ගණන |
| 15 | වෘත්තීය වර්ගීකරණ පංතිය | 3 | සංඛ්‍යාත්මක | වෘත්තීය වර්ගීකරණ පංතිය (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණයට අනුව)<br>(8 වන ඇමුණුම බලන්න) |

9.2* = පූර්ණ සංඛ්‍යා 7 ක්, දශම තිත සහ දශම සංඛ්‍යා දෙකක් සමග උපරිම සංඛ්‍යා 10 ක් තිබිය යුතු වේ.

11.2** = පූර්ණ සංඛ්‍යා 9 ක්, දශම තිත සහ දශම සංඛ්‍යා 2 ක් ඇතුලුව උපරිම සංඛ්‍යා 12 ක් තිබිය යුතු වේ.

*** (සියලු කාර්ය මණ්ඩලය ඇතුළත්ව) එක් ලිපිගොනුවක් වශයෙන් විස්තර යවනු ලබයි නම්, අංකය "01" විය යුතු ය. "විධායක සහ විධායක නොවන" වශයෙන් ප්‍රභේද දෙකක් යටතේ විස්තර යවනු ලබයි නම් අංකය "02" විය යුතු ය.

(13) (1) මෙම නියෝගයේ (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, මෙම නියෝග අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(2) මෙම නියෝගවල (6) වන සහ (7) වන නියෝග, 2012 අංක 02 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 23 අ වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියමයක් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.